# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන

# 2018/2019

## උපදෙස් පොත

**ද්විතියික හා තෘතියික අධ්‍යාපන අධ්‍යයනාංශය**
**අධ්‍යාපන පීඨය**
**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**නාවල, නුගේගොඩ**

**දු. අ : 011-2853777 Ext. 231, 398,389**
**Fax : 011- 2436858**
**විද්‍යුත් ලිපිනය: postmast@ou.ac.lk**
**වෙබ් ලිපිනය : www.ou.ac.lk**

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන - 2018/2019

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය 2018/2019 අධ්‍යයන වර්ෂයේ දී ඉදිරිපත් කරනු ලබන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන පිළිබඳ විස්තර මෙම පොත් පිංච මඟින් ඉදිරිපත් කෙරේ.

මෙහි අඩංගු තොරතුරුවල නිවැරදි බව සහතික කරලීම සඳහා සෑම උත්සාහයක්ම ගන්නා අතර ප්‍රතිපත්තිමය හෝ මූල්‍යමය කරුණු හේතු කොට ගෙන ඒවා පසුකාලීනව වෙනස් කිරීම්වලට හෝ සංශෝධනවලට භාජනය විය හැකි ය.

ද්විතියික හා තෘතියික අධ්‍යාපන අධ්‍යයනාංශය
අධ්‍යාපන පීඨය
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නාවල
නුගේගොඩ.

# අන්තර්ගතය


| | | පිටු අංකය |
|---|---|---|
| **පළමු කොටස - සාමාන්‍ය තොරතුරු** | | **1 - 9** |
| 1.0 | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 4 |
| 1.1 | පාඨමාලා හා අධ්‍යයන වැඩසටහන | 4 |
| 1.2 | ඉගැන්වීමේ ක්‍රම | 7 |
| 1.3 | ඇගයීමේ ක්‍රම | 7-8 |
| 1.4 | ප්‍රාදේශීය සේවා | 8 |
| 1.5 | වෙනත් සේවා | 9 |
| 1.6 | අධ්‍යයන වැඩසටහන් ගාස්තු | 9 |
| **දෙවන කොටස - අධ්‍යාපන පීඨය** | | **9 - 15** |
| 2.0 | පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන | 10 |
| 2.1 | පරමාර්ථ | 10 |
| 2.2 | ඇතුළත්වීම සඳහා සුදුසුකම් | 10 |
| 2.3 | අධ්‍යයන වැඩසටහනෙහි පාඨමාලා අන්තර්ගතය | 10-11 |
| 2.4 | දින පාසල් සහ ශිෂ්‍ය උපදේශන සැසි | 11 |
| 2.5 | ඉගැන්වීමේ මාධ්‍යය | 12 |
| 2.6 | ප්‍රාදේශීය/අධ්‍යයන මධ්‍යස්ථාන | 12 |
| 2.7 | ඇගයුම | 12-13 |
| 2.8 | සහතික ප්‍රදානය | 14 |
| 2.9 | ගාස්තු | 14 |
| 2.10 | අධ්‍යයන වැඩසටහනෙහි ආරම්භය | 15 |
| 2.11 | අයදුම්පත පිරවීම සඳහා උපදෙස් | 16 |

## පළමුවන කොටස

### සාමාන්‍ය තොරතුරු

### 1.0 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

වර්ෂ 1980 දී ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ශාස්ත්‍රීය වශයෙන් ස්වයංපාලනයක් සහිත ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලයකි. එය සැලසුම් කොට ඇත්තේ වයස අවුරුදු 18 සහ ඊට වැඩි පුද්ගලයින්ට, මූලික වශයෙන් තමන්ට විවේකී කාල වේලාවට ස්වකීය නිවෙස්වල සිටියදීම ප්‍රථම උපාධියක්, පශ්චාත් උපාධියක්, ඩිප්ලෝමාවක් (සම්මාන සහතිකය ඇතුළුව) සහතික පත්‍රයක් හෝ වෙනත් යම්කිසි ප්‍රදානයක් හෝ ලබා ගත හැකි අධ්‍යයන වැඩසටහන් හැදෑරීමට හැකිවන අන්දමිනි.

විවෘත විශ්වවිද්‍යාලය ස්වකීය අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම මගින් උපාධි, ඩිප්ලෝමා සහ සහතික ප්‍රදානය කරයි. පූර්ණ කාලීන කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදෙන, සාමාන්‍ය ආකාරයේ මධ්‍යම මණ්ඩපයක් එය සතුව ඇත. ස්වකීය වූ පාලන සභාවක් ද එය සතුව ඇති අතර එය විශ්වවිද්‍යාලයෙහි විධායක සහ ශාස්ත්‍රීය මණ්ඩලය මෙන්ම පාලන අධිකාරිය ද වේ. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විවෘත විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ වෙනත් විශ්වවිද්‍යාලවලට හිමි නෛතික හා ශාස්ත්‍රීය තත්ත්වයම දරයි.

විවෘත විශ්වවිද්‍යාලය එයට බැඳෙන්නා වූ සිසුන්ගේ පක්ෂයෙන් බලන කල, නිවසෙහි සිට අධ්‍යාපනය ලබා දෙන විශ්වවිද්‍යාලයක් මෙන්ම පසු අධ්‍යාපනික අවස්ථා සලසා දෙන විශ්වවිද්‍යාලයක් ද වෙයි. කවර හෙයින් ද යත් පාසල් හැර යාමේ දී අවස්ථාවක් අහිමි වූ හෝ යම් අධ්‍යාපන තත්ත්වයක් ලබා නොගත් තැනැත්තාටත් විවෘත විශ්වවිද්‍යාලය එම අවස්ථාව සලසා දෙන බැවිනි. අනෙකුත් අයට තමන් කලින් ලබා ගත් අවස්ථා හා තත්ත්වයන් වැඩි දියුණු කර ගනිමින් ඒවාට තව තවත් අවස්ථා එක් කර ගැනීමට ද ඉඩ සලසයි. මෙම අවස්ථාවන්ගෙන් නිසි ඵල ලබා ගැනීම සඳහා ඔවුහු වෙහෙසී වැඩ කළ යුතු වෙති.

### 1.1 පාඨමාලා හා අධ්‍යයන වැඩසටහන

විවෘත විශ්වවිද්‍යාලයේ වාග් මාලාවට අනුව **පාඨමාලාවක්** යන්නෙන් අදහස් කරන්නේ සාමාන්‍යයෙන් එක් අධ්‍යයන වර්ෂයක් තුළ දී සම්පූර්ණ කරනු ලබන මූලික අධ්‍යයන ඒකකයකි. ඒවා අනිවාර්ය හා වෛකල්පික විය හැකි ය.

අනිවාර්ය පාඨමාලා හා වෛකල්පික පාඨමාලා එකතු වී අධ්‍යයන වැඩසටහන් සැකසේ. අධ්‍යයන වැඩසටහනක් සාර්ථක ලෙස හදාරා නිම කිරීම සහතිකයක්, ඩිප්ලෝමාවක් හෝ උපාධියක් ප්‍රදානය කිරීම සඳහා සුදුසුකමක් වේ. අනිවාර්ය පාඨමාලා යනු යම්කිසි අධ්‍යයන වැඩසටහනක ව්‍යුහය තුළ වූ ද කිසියම් වැඩසටහනක අවශ්‍යතා සපුරාලීම සඳහා ශිෂ්‍යයන් විසින් සම්පූර්ණ කළ යුතු ම වූ ද පාඨමාලාවකි. විවෘත විශ්වවිද්‍යාලය සහතිකයක්,

ඩිප්ලෝමාවක් හෝ උපාධියක් ලබා දෙන ශාස්ත්‍රීය අධ්‍යයන වැඩසටහන් ඉදිරිපත් කරයි. ඒවා පහත සඳහන් ප්‍රභේද අතුරෙන් එකකට අයත් විය හැකි ය.

1. පදනම් අධ්‍යයන වැඩසටහන්
2. සහතික පත්‍ර අධ්‍යයන වැඩසටහන්
3. උසස් සහතික පත්‍ර අධ්‍යයන වැඩසටහන්
4. ඩිප්ලෝමා අධ්‍යයන වැඩසටහන්
5. ප්‍රථම උපාධි අධ්‍යයන වැඩසටහන්
6. පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන්
7. වැඩිදුර අධ්‍යයන වැඩසටහන්
8. ඒකාංගික වැඩසටහන්

පදනම් අධ්‍යයන වැඩසටහන් සෙසු ශාස්ත්‍රීය අධ්‍යයන වැඩසටහන්වලට ඇතුළු වීමේ දොරටුව වෙයි. මෙම පදනම් අධ්‍යයන වැඩසටහන් මූලික විෂය ක්ෂෙත්‍රය තුළ පළමුවන මට්ටම (F1) සහ දෙවන මට්ටම (F2) යනුවෙන් මට්ටම් දෙකකින් පවත්වනු ලැබේ.

කලා, වාණිජ්‍යය, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, හෝ තාක්ෂණික විද්‍යාව වැනි අධ්‍යයන ක්ෂෙත්‍රයක පදනම් අධ්‍යයන වැඩසටහන් සාර්ථක ලෙස සම්පූර්ණ කරන ශිෂ්‍යයා සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලවලට ඇතුළු වීම සඳහා අවශ්‍ය අධ්‍යාපන මට්ටමට සමාන මට්ටමකට එළඹෙයි.

තනි වැඩසටහන් යම් ප්‍රමුඛ අධ්‍යාපන වැඩසටහනකට අයත් නොවන වැඩසටහන් වේ. ඒවා එක් එක් පුද්ගලයාගේ පුද්ගලික අවශ්‍යතා අනුව ස්වාධීනව හැදෑරිය හැකි ය.

වැඩසටහනක **ශාස්ත්‍රීය අගය** දැක්වීම සඳහා විවෘත විශ්වවිද්‍යාලය Credit යන වචනය භාවිත කරයි. “යම් විභාගයක දී ශිෂ්‍යයෙක් පෙන්වන දක්ෂතාවය” යන්න මෙම වචනයෙන් අදහස් නොවේ. (උදා:- අ.පො.ස. සාමාන්‍ය/උසස් පෙළ විභාගවල දී සම්මාන සාමාර්ථය)

කිසියම් පාඨමාලාවක/වැඩසටහනක ශාස්ත්‍රීය අගය 18 යන්නෙන් අදහස් වන්නේ එම පාඨමාලාව/වැඩසටහන සඳහා මිඩංගු කළ යුතු අධ්‍යයන කාලය (සාමාන්‍යයෙන් සතියකට පැය 15ක් පමණ බැගින් සති 30ක් සඳහා) පැය 450 කි. වෙනත් ශාස්ත්‍රීය අගයයන් ඇති පාඨමාලා සඳහා ස්වයං අධ්‍යයන කාලය, ශාස්ත්‍රීය අගය අනුව වෙනස් වේ.
සාමාන්‍ය අධ්‍යයන වැඩසටහනක් හෝ දෙකක් හෝ තුළ අධ්‍යයන වර්ෂයක ශිෂ්‍යයෙකුට ලියාපදිංචි වීමට ඉඩ ලැබෙන්නේ උපරිම වශයෙන් ශාස්ත්‍රීය අගය (credit) 36 ට සමාන අධ්‍යයන වටිනාකමක් ඇති පාඨමාලා සංඛ්‍යාවකට ය. ලියාපදිංචි විය හැකි අවම පාඨමාලා සංඛ්‍යාව ශාස්ත්‍රීය අගය 8 ට සමාන වේ. ශාස්ත්‍රීය අගය 36 ක පාඨමාලාවලට ලියාපදිංචි වී ඇති සිසුන්ට ඊට අමතරව, ශාස්ත්‍රීය අගය 8 ට නොවැඩි අධ්‍යයන වටිනාකමක් ඇති වන සේ වැඩිදුර අධ්‍යයන පාඨමාලාවලට ද ලියාපදිංචි විය හැකි ය.

අක්ෂර හා සංඛ්‍යා හතකින් සමන්විත පාඨමාලා කේතයක් පහත සඳහන් පරිදි එකිනෙක පාඨමාලාවන්ට පවරා ඇත. (උදා- STP8501)

| | | |
|---|---|---|
| පළමු සහ දෙවන අක්ෂරය | - | අධ්‍යයන අංශය (1 වගුව) |
| තුන්වන අක්ෂරය | - | අධ්‍යයන වැඩසටහන (2 වගුව) |
| පළමුවන සංඛ්‍යාංකය | - | වැඩසටහන තුළ අධ්‍යයන මට්ටම |
| දෙවන සංඛ්‍යාංකය | - | ශාස්ත්‍රිය අගය (3 වන වගුව) |
| අවසාන සංඛ්‍යාංක දෙක | - | පාඨමාලාවේ සුවිශේෂ අනුක්‍රමික අංකය |

**වගුව 1 අධ්‍යයන ක්ෂෙත්‍ර අනුව පාඨමාලා කේත**

| පීඨය | අධ්‍යයන ක්ෂෙත්‍රය | පාඨමාලා කේතය |
|---|---|---|
| අධ්‍යාපන | ද්විතියික හා තෘතියික අධ්‍යාපන | ST |
| | මුල් ළමාවිය අධ්‍යාපන | EC |
| | විශේෂ අවශ්‍යතා අධ්‍යාපන | SN |
| ස්වාභාවික විද්‍යා | ශුද්ධ විද්‍යාව | PS |
| | උද්භිද විද්‍යාව | BT |
| | රසායන විද්‍යාව | CH |
| | භෞතික විද්‍යාව | PH |
| | සත්ත්ව විද්‍යාව | ZO |
| | ගණිතය | MA |
| | හෙද සේවය | NS |
| ඉංජිනේරු තාක්‍ෂණ | සිවිල් තාක්‍ෂණය | TC |
| | සන්නිවේදන තාක්‍ෂණය | TL |
| | පරිගණක විද්‍යාව | CS |
| | විදුලි තාක්‍ෂණය | TE |
| | ඉලෙක්ට්‍රොනික තාක්‍ෂණය | TN |
| | ඉංජිනේරු විද්‍යාව | EN |
| | යාන්ත්‍රික තාක්ෂණය | TN |
| | පේෂකර්ම තාක්‍ෂණය | TT |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | භාෂා අධ්‍යයන | L S |
| | නීතිය | LW |
| | කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍ය | MC |
| | සමාජ අධ්‍යයන | SS |

**වගුව 2 - පාඨමාලා මට්ටම**

ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව ( SLQF) 2015 ට අනුව

| SLQF මට්ටම | පිරිනමනු ලබන සුදුසුකම (Qualification Awarded) |
|---|---|
| 12 | දර්ශන ශූරි (Doctor of Philosophy) |
| 11 | දර්ශනපති (Master of Philosophy) |
| 10 | ශාස්ත්‍රපති (Masters with course work and a research component) |
| 09 | ශාස්ත්‍රපති (Masters by course work) |
| 08 | පශ්චාත් උපාධි ඩිප්ලෝමා (Postgraduate Diploma) |
| 07 | පශ්චාත් උපාධි සහතිකපත්‍ර (Postgraduate Certificate) |
| 06 | ගෞරව උපාධි (Bachelors Honours) |
| 05 | උපාධි (Bachelors) |
| 04 | උසස් ඩිප්ලෝමා (Higher Diploma) |
| 03 | ඩිප්ලෝමා (Diploma) |
| 02 | උසස් සහතිකපත්‍ර (GCE A/L or equivalent) |
| 01 | සහතිකපත්‍ර( (GCE O/L or equivalent) |

**වගුව 3 - ශාස්ත්‍රීය අගය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| කේතයේ දෙවන සංඛ්‍යාංකය | 8 | 7 | 6 | 5 | 4 | 3 | 2 | 1 | 0 |
| ශාස්ත්‍රීය අගය | 8 | 7 | 6 | 5 | 4 | 3 | 2 | 1 | 0 |

## 1.2 ඉගැන්වීමේ ක්‍රම

මෙය බහු මාධ්‍ය මත පදනම් වී ඇත.

### *(1) මුද්‍රිත පාඩම්*

ඉගැන්වීමේ ක්‍රමයෙහි මූලික අංගය වශයෙන් සැළකිය හැක්කේ ශිෂ්‍යයාට දෙනු ලබන මුද්‍රිත පාඩම් ය. මේවා මගින් අධ්‍යයනය කළ යුතු විෂය ක්‍ෂෙත්‍රය ශිෂ්‍යයා වෙත ඉදිරිපත් කෙරේ. එසේම එමගින් දේශනවලින් වන මෙහෙය ද ඉටු වේ. පාඩම් සමග ඉදිරිපත් කර ඇති ක්‍රියාකාරකම් හා අභ්‍යාස මගින් සිසුන්ගේ විශ්ලේෂණ හැකියාව හා චින්තන ශක්තිය වර්ධනය කිරීම අපේක්‍ෂා කෙරේ.

### *(2) ශ්‍රව්‍ය දෘශ්‍යාධාර*

මුද්‍රිත පාඩම්වලට අමතරව ශ්‍රව්‍ය දෘශ්‍යාධාර යොදා ගැනීමට විවෘත විශ්වවිද්‍යාලය හැකිතාක් දුරට උත්සාහ කරයි. ස්වයං අධ්‍යයනයෙහි යෙදෙන ශිෂ්‍යයාට මේවා විශේෂයෙන් වැදගත් වේ. සිසුන්ට සපයන ශ්‍රව්‍ය පටිවලට අමතරව සෑම ප්‍රාදේශීය මධ්‍යස්ථානයකම පාඨමාලාවලට අදාල ශ්‍රව්‍ය පට නැරඹීමේ/ශ්‍රවණය කිරීමේ පහසුකම් ඇත. විශේෂයෙන් ම නාවල ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ඒ සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය මධ්‍යස්ථානයක් විවෘත කර ඇත. සතියේ දිනවල දී සහ සති අන්තවල දී උදේ 9.00 සිට සවස 7.00 දක්වා එය විවෘතව ඇති අතර සිසුන්ට තම තමන්ගේ පාඨමාලාවලට අදාළ ශ්‍රව්‍ය දෘශ්‍ය පටි නැරඹීමට/ශ්‍රවණය කිරීමට එහි පහසුකම් සපයා ඇත.

*(3) දින පාසල් හා උපදේශන සේවා*

ශිෂ්‍යයන්ට ස්වාධීනව ඉගෙන ගැනීම සඳහා මුද්‍රිත පාඩම් හා ශ්‍රව්‍ය දෘශ්‍යාධාර සැලසුම් කොට ඇතත් ඊට අමතරව දින පාසල් හා නිබන්ධන සැසි මගින් උපදෙස් ලබා දීම විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශිය හා අධ්‍යයන මධ්‍යස්ථානවලදී සිදු කෙරෙනු ඇත.

*(4) පුස්තකාල පහසුකම්*

සියලුම ප්‍රාදේශිය හා අධ්‍යයන මධ්‍යස්ථානවල පුස්තකාල පහසුකම් සෑහෙන ප්‍රමාණයකට ඇත. නාවල පිහිටි පුස්තකාලය සිසුන් සඳහා සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 7.00 දක්වා විවෘතව ඇත. රජයේ නිවාඩු දිනවල සහ සති අන්තයේ දී පෙ.ව. 9.00 සිට ප.ව. 6.00 දක්වා විවෘත ව ඇත.

**1.3 ඇගයීම් ක්‍රම**

ශිෂ්‍යයන්ගේ ඉගෙනීම අඛණ්ඩ ඇගයීම් (ලිඛිත පැවරුම්, අඛණ්ඩ තක්සේරුකරණ පරීක්ෂණ (CAT) සහ ක්‍රියාකාරකම් පාදක දිනපාසල්) සහ අවසානයේ දි ලිඛිත විභාගයකින්ද අගයනු ලැබේ. සෑම පාඨමාලාවක් සඳහා ම සිසුන් නියමිත පැවරුම් සංඛ්‍යාවක් සම්පූර්ණ කළ යුතු ය. මෙම පැවරුම් උපදේශකවරුන්ගේ ගුණදොස් විවේචන හා අදාළ ශ්‍රේණි ද සහිතව නැවත සිසුන්ට භාර දෙනු ලැබේ. විවෘත විශ්වවිද්‍යාලයේ ඇගයීම් පද්ධතියෙහි ඉතාමත් වැදගත් කොටසක් ලෙස සලකන මෙම පැවරුම් ඒ ඒ පාඨමාලාව අනුව විවිධ ස්වරූපයක් ගනු ඇත. නිදසුන් : විද්‍යාගාර වැඩ, ලිඛිත පැවරුම්, ප්‍රායෝගික ක්‍රියාකාරකම් ආදිය. එක් එක් පාඨමාලාවට නියමිත අඛණ්ඩ ඇගයීම් පටිපාටිය පාඨමාලාව ආරම්භයේ දී සිසුන්ට ද දන්වනු ඇත.

පැවරුම් සාර්ථක ලෙස නිම කිරීමෙන් පසු අවසාන විභාගයට පෙනී සිටීමට ශිෂ්‍යයාට හැකි වේ. කිසියම් පාඨමාලාවක අවසාන විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබන සිසුන් එම පාඨමාලාව සඳහා නැවත ලියාපදිංචි විය යුතු ය.

අවසාන විභාගය අසමත් වන සිසුන් නැවත විභාගයට පෙනී සිටිය යුතු ය. එහෙත් එම පාඨමාලාවන් සඳහා නැවත පැවරුම් ඉදිරිපත් කළ යුතු නොවේ.

**1.4 ප්‍රාදේශිය සේවා**

ශිෂ්‍යයන්ට ඔවුනොවුන් හමු වී සාකච්ඡා පැවැත්වීම සඳහාත් පන්ති කාමර ඉගැන්වීම සඳහාත් පහසුකම් සැලසීමට විවෘත විශ්වවිද්‍යාලය මගින් දිවයින පුරා ප්‍රාදේශිය හා අධ්‍යයන මධ්‍යස්ථාන පිහිටුවා ඇත. දැනට විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශිය/අධ්‍යයන මධ්‍යස්ථාන පිහිටුවා ඇත්තේ මෙහි දක්වා ඇති ස්ථානවල ය.

**ප්‍රාදේශීය මධ්‍යස්ථාන**

| | | | |
|---|---|---|---|
| WP10 | කොළඹ | NP40 | යාපනය |
| CP20 | මහනුවර | NC50 | අනුරාධපුරය |
| SP30 | මාතර | EP60 | මඩකලපුව |
| NW70 | කුරුණෑගල | UP80 | බදුල්ල |
| SG90 | රත්නපුරය | | |

**අධ්‍යයන මධ්‍යස්ථාන**

| | | | |
|---|---|---|---|
| WP11 | ගම්පහ | SG91 | කෑගල්ල |
| WP12 | කළුතර | NW71 | පුත්තලම |
| CP21 | හැටන් | NW72 | කුලියාපිටිය |
| SP31 | අම්බලන්ගොඩ | NP41 | වව්නියාව |
| SP32 | ගාල්ල | NP42 | කිලිනොච්චිය |
| SP33 | අම්බලන්තොට | EP61 | අම්පාර |
| UP81 | බණ්ඩාරවෙල | EP62 | ත්‍රිකුණාමලය |
| UP82 | මොණරාගල | NP43 | මුලතිව් |
| NC51 | පොලොන්නරුව | | මන්නාරම |

මෙම ප්‍රාදේශීය/අධ්‍යයන මධ්‍යස්ථානවල දී මුද්‍රිත පාඩම් බෙදා දීමට පහසුකම් සලසා ඇත. එසේම සම්පූර්ණ කළ පැවරුම් භාර ගැනීම ද මෙම මධ්‍යස්ථානවල දී සිදු කෙරේ. කොළඹ, මහනුවර සහ මාතර මධ්‍යස්ථානවල විද්‍යාගාර පහසුකම් ද ඇත.

කෙසේ වුවද පන්ති කාමර ඉගැන්වීම සඳහා අධ්‍යයන මධ්‍යස්ථානයක් ප්‍රයෝජනයට ගැනීම, ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් විසින් එම මධ්‍යස්ථාන තෝරා ගැනීම සහ ආචාර්ය මහත්ම මහත්මීන් ලබා ගැනීමේ පහසුව මත රැඳෙන බව සැළකිය යුතුය.

## 1.5 වෙනත් සේවා

*(1) ආපන ශාලා පහසුකම්*

විශ්වවිද්‍යාල ආපන ශාලාවෙන් සතියේ දිනවල හා සති අන්තවල දී සාධාරණ මිලකට ආහාර ලබා ගත හැකි ය. මහනුවර හා මාතර මධ්‍යස්ථානවලද ආපනශාලා පහසුකම් ඇත.

## 1.6 අධ්‍යයන වැඩසටහන් ගාස්තු

අධ්‍යයන වැඩසටහනකට ලියාපදංචි වීමේ දී හා ගාස්තු ගෙවීමට නියමිත අවස්ථාවල දී ඒවා අප්‍රමාදව ගෙවිය යුතු ය. පූර්ව දැනුම් දීමකින් තොරව ඕනෑම අවස්ථාවක ගාස්තු සංශෝධනය කිරීමේ බලය විශ්වවිද්‍යාලය සතු ය. එක් එක් අධ්‍යයන වැඩසටහන අනුව ගාස්තු වෙනස් වන අතර **2.9** අංකය යටතේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහනෙහි ගාස්තු පිළිබඳ විස්තර ඇතුළත් කර ඇත.

## දෙවන කොටස

**අධ්‍යාපන පීඨය**

අධ්‍යාපන පීඨය අධ්‍යයනාංශ තුනකින් සමන්විතය.

1. ද්විතියික හා තෘතියික අධ්‍යාපන අධ්‍යයනාංශය
2. ප්‍රාථමික හා මුල් ළමාවිය අධ්‍යයනාංශය
3. විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශය

ද්විතියික හා තෘතියික අධ්‍යාපන අධ්‍යයනාංශය මගින් ඉදිරිපත් කරන අධ්‍යයන වැඩසටහන් අටකි.

1. අධ්‍යාපන දර්ශනශූරී උපාධි වැඩසටහන
2. අධ්‍යාපන දර්ශනපති උපාධි වැඩසටහන
3. ගුරු අධ්‍යාපනය පිළිබඳ (ජාත්‍යන්තර) ශාස්ත්‍රපති උපාධි වැඩසටහන
4. අධ්‍යාපනපති උපාධි වැඩසටහන
5. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන
6. අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලාව) උපාධි වැඩසටහන
7. අධ්‍යාපනවේදී (ස්වාභාවික විද්‍යා) උපාධි වැඩසටහන
8. පර්යේෂණ පිළිබඳ කෙටිකාලීන සහතික පත්‍ර පාඨමාලාව
9. බහුශ්‍රේණි ඉගැන්වීම පිළිබඳ කෙටිකාලීන සහතික පත්‍ර පාඨමාලාව

**2.0 පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන**

මෙය මාස 15 ක අධ්‍යයන වැඩසටහනකි.

**2.1 පරමාර්ථ**

මෙම වැඩසටහනෙහි මූලික පරමාර්ථය වන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින උපාධිධාරී ගුරුවරුන්ට සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවයේ නියුතු උපාධිධාරී නිලධාරීන්ට වෘත්තිය පුහුණුවක් ලබා දීමයි.

**2.2 ඇතුළත්වීම සඳහා සුදුසුකම්**

1. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් අවම වශයෙන් අවුරුදු **තුනක (03)** ප්‍රථම උපාධියක් හෝ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගත් ඊට සමාන සුදුසුකම් ලබා තිබීම සහ

2. පිළිගත් පාසලක සේවයේ නියුතු ගුරුවරයකු හෝ විදුහල්පතිවරයකු හෝ ගුරු උපදේශකවරයකු වීම හෝ ගුරු අධ්‍යාපනඥ සේවයේ හෝ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියකු වීම හෝ විශ්වවිද්‍යාල, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, කාර්මික විද්‍යාල, ගුරු විද්‍යාල පූර්ණකාලීන අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයකු වීම හෝ ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවකු වීම හෝ ජාතික අධ්‍යාපන ආයතනයේ කථිකාචාර්යවරයකු වීම සහ

3. **2017 ඔක්තෝම්බර් 01** දිනට හෝ ඊට ප්‍රථම පත්වීම ලබා එදින සිට අඛණ්ඩව සේවයේ යෙදී සිටීම.

4. ඔබගේ උපාධිය ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් එකක් නොවේ නම් හෝ එය මාර්ගගතව (On line) ලබා ගත් **උපාධියක් නම් එම උපාධිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් බව සනාථ කළ යුතුය.(විදේශ උපාධි සඳහා අවම වශයෙන් වසර තුනක (3) කාලපරිච්ඡේදය සනාථ කළ යුතුය.)**

- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් **2018 ඔක්තෝම්බර් මස** 14 දින පවත්වනු ලබන තෝරා ගැනීමේ පරීක්ෂණය සඳහා ඉල්ලුම්පත් ලබාගත් මධ්‍යස්ථානයේදීම සුදුසුකම් ඇති සියලුම අයදුම්කරුවන් පෙනී සිටිය යුතුය.
- තෝරා ගැනීමේ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූවන්ගේ ලේඛනය 2018 **නොවැම්බර්** මස විශ්වවිද්‍යාල වෙබ් අඩවිය වන www.ou.ac.lk හි පළ කරනු ඇත.
- වැඩසටහන සඳහා සුදුසුකම් ලැබූවන් ලියාපදිංචි කිරීම 2018 **දෙසැම්බර්** මස සිදු කරනු ලැබේ.
- **2019 ජනවාරි** මස පවත්වනු ලබන සමාරම්භක සැසියට සහභාගි වීම අනිවාර්ය වේ.

## 2.3 අධ්‍යයන වැඩසටහනෙහි පාඨමාලා අන්තර්ගතය

**අනිවාර්ය පාඨමාලා (6)**

1. STP8501 අධ්‍යාපන මනෝ විද්‍යාව
2. STP8502 අධ්‍යාපනයේ පදනම
3. STP8303 අධ්‍යාපන මිනුම සහ ඇගයුම
4. STP8504 අධ්‍යාපන තාක්ෂණය
5. STP8505 තුලනාත්මක අධ්‍යාපනය හා අධ්‍යාපන ගැටලු
6. STP8306 අධ්‍යාපනයේ මාර්ගෝපදේශනය හා උපදේශනය

**වෛකල්පික පාඨමාලා (2)**

7. STP8307 විෂයමාලා න්‍යාය හා පරිචය
හෝ
STP8308 අධ්‍යාපන කළමනාකරණය
} මින් එකක්

8. STP8309 ළමා අයිතිවාසිකම්
හෝ
STP8310 ප්‍රාථමික අධ්‍යාපනය
හෝ
STP8311 අන්තර්කරණ අධ්‍යාපනය
හෝ
STP8312 බහුශ්‍රේණි ඉගැන්වීම
} මින් එකක්

**අනිවාර්ය අඛණ්ඩ ප්‍රායෝගික වැඩසටහන (සති දහයක (10)**

9. STE8811 ප්‍රායෝගික ඉගැන්වීම

අධ්‍යාපන තාක්ෂණය පාඨමාලාව (STP8504) යටතේ හදාරනු ලබන විශේෂ ඉගැන්වීම් ක්‍රම සඳහා පහත සඳහන් විෂයයන් අතරින් එක් විෂයයක් හෝ දෙකක් තෝරා ගැනීමට ශිෂ්‍යයාට හැකි ය.

| | | | |
|---|---|---|---|
| 1. | බෞද්ධ/ක්‍රිස්තියානි ඉස්ලාම් ධර්මය/හින්දු ආගම | 5. | විද්‍යාව |
| | | 6. | ගණිතය |
| 2. | සිංහල භාෂාව/දෙමළ භාෂාව | 7. | වාණිජ්‍යය |
| 3. | ඉංග්‍රීසි භාෂාව | 8. | ගෘහ ආර්ථික විද්‍යාව |
| 4. | ඉතිහාසය, භූගෝල විද්‍යාව, පුරවැසි අධ්‍යාපනය | 9. | ප්‍රාථමික පාසලේ සමෝධානිත විෂයන් |
| 10. | සෞන්දර්ය අධ්‍යාපනය | 11. | තොරතුරු තාක්ෂණය |

ප්‍රායෝගික ඉගැන්වීම සඳහා ද විශේෂ ඉගැන්වීම් ක්‍රම සඳහා තෝරා ගන්නා ලද විෂයය/විෂයන් තෝරා ගැනීම වඩාත් සුදුසු වේ.

## 2.4 දින පාසල් හා ශිෂ්‍ය උපදේශන සැසි

දැනුම ලබා දීමේ ප්‍රධාන ක්‍රමය මුද්‍රිත පාඩම් වේ. මෙම මුද්‍රිත පාඩම්වලට අමතරව ශ්‍රව්‍ය දෘශ්‍ය පට භාවිතයට ද කටයුතු සලසා ඇත. ප්‍රාදේශීය/අධ්‍යයන මධ්‍යස්ථානවල දී දින පාසල් දහතුනක් (13) ක් පවත්වනු ලැබේ. සාකච්ඡා, කාර්ය සැසි, ක්‍රියාකාරකම් පාදක ස්වරූපයෙන් පවත්වනු ලබන මෙම දින පාසල්වල දී මුද්‍රිත පාඩම් යාවත්කාලීන කිරීමට හා සිසුන්ගේ අධ්‍යයන ගැටලු සාකච්ඡා කිරීමටත් අපේක්ෂා කෙරේ.

දින පාසල්වලට අමතරව කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය කරනු ලබන උපදේශන සැසි සඳහා පැය 30 කට ආසන්න කාලයක් වෙන් කර ඇත. මෙම උපදේශන සැසිවල දී සිසුන්ගේ ඉගෙනීම් කටයුතු සම්බන්ධ ගැටලු, පැවරුම් සම්බන්ධ ගැටලු හා වෙනත් අදාළ ගැටලු සාකච්ඡා කිරීමටත්, ඔවුන් විභාග සඳහා යොමු කිරීමටත් අපේක්ෂිතය.

## 2.5 ඉගැන්වීමේ මාධ්‍යය

මෙම වැඩසටහන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

## 2.6 ප්‍රාදේශීය/අධ්‍යයන මධ්‍යස්ථාන

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන සඳහා දැනට පහත සඳහන් ප්‍රාදේශීය මධ්‍යස්ථාන හා අධ්‍යයන මධ්‍යස්ථාන යොදා ගෙන ඇත. **එහෙත් එක් එක් වර්ෂයේ දී එක් එක් මධ්‍යස්ථානය තෝරා ගන්නා සිසුන් සංඛ්‍යාව, මාධ්‍යය හා ඒ ඒ මධ්‍යස්ථානයට අනුබද්ධව කථිකාචාර්යවරුන් ලබා ගැනීමේ පහසුව මත ඒවා තවදුරටත් මධ්‍යස්ථාන ලෙස යොදා ගැනීම හෝ නොගැනීම තීරණය වනු ඇත.**

| | |
|---|---|
| කොළඹ | කුරුණෑගල |
| මාතර | කෑගල්ල |
| යාපනය | රත්නපුර |
| අනුරාධපුරය | බණ්ඩාරවෙල |
| මඩකලපුව | ගම්පහ |
| ගාල්ල | අම්පාර |
| අම්බලන්ගොඩ | ත්‍රිකුණාමලය |
| හැටන් | පුත්තලම |
| වව්නියාව | අම්බලන්තොට |
| මහනුවර | කළුතර |
| බදුල්ල | මුලතිව් |
| මන්නාරම | පොළොන්නරුව |

- **සැලකිය යුතුයි : 01) අයදුම්කරුවන් විසින් ඉල්ලුම් කරනු ලබන අධ්‍යයන වැඩසටහන සඳහා ලියාපදිංචි කරගනු ලබන මධ්‍යස්ථානය සහ මාධ්‍යය කිසිසේත් වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.**

## 2.7 ඇගයුම

ඇගයුම කරනු ලබන්නේ පහත සඳහන් ක්‍රම මගිනි.

**(අ) නියම කරන ලද අනිවාර්ය ලිඛිත පැවරුම් මගින් සිදු කරන අඛණ්ඩ ඇගයුම්**

මේවා නියමිත දිනට සම්පූර්ණ කොට භාර දිය යුතුය. ශාස්ත්‍රීය අගය 5 ක් වන සෑම පාඨමාල්වක් සඳහා ම පැවරුම් තුනක් අන්තර්ගත වේ. එවැනි පාඨමාලාවක අවසාන පරීක්‍ෂණය සඳහා යෝග්‍යතාව ලැබීමට නියමිත පැවරුම් 3 ම සම්පූර්ණ කිරීම අත්‍යාවශ්‍ය වන අතර සෑම පැවරුමක් සඳහා ම C ශ්‍රේණියක් හෝ ඊට ඉහළ ශ්‍රේණියක් ලැබිය යුතු ය. ඒ අනුව සමස්ත අඛණ්ඩ ඇගයීම් ලකුණ හෙවත් පැවරුම් 3 හි මුළු ලකුණුවල සාමාන්‍ය (OCAM) ලකුණු 40 ක් හෝ ඊට ඉහළ ලකුණක් වීම අත්‍යාවශ්‍ය වේ.

ශාස්ත්‍රීය අගය 3 ක් වන සෑම පාඨමාල්වක් සඳහා ම පැවරුම් දෙකක් (2) අන්තර්ගත වේ. එවැනි පාඨමාලාවක් සඳහා ද නියමිත පැවරුම් 2 ම සම්පූර්ණ කිරීම අත්‍යාවශ්‍ය වන අතර සෑම පැවරුමක් සඳහා ම C ශ්‍රේණියක් හෝ ඊට ඉහළ ශ්‍රේණියක් ලැබිය යුතු ය. ඒ අනුව සමස්ත අඛණ්ඩ ඇගයීම් ලකුණ (OCAM) 40 හෝ ඊට ඉහළ ලකුණක් වීම අත්‍යාවශ්‍ය වේ.

කිසියම් පාඨමාලාවක් සඳහා නියමිත අවසාන ශ්‍රේණිය තීරණය කිරීමේ දි අඛණ්ඩ ඇගයීම් ලකුණු වලින් 40% ක් ද, අවසාන පරීක්ෂණයේ ලකුණුවලින් 60% ක් ද යොදා ගනු ලැබේ.

***සැළකිය යුතුයි**

යම්කිසි අවස්ථාවකදී කිසියම් පාඨමාලවක අවසාන පරික්ෂණය සඳහා යම් අපේක්ෂකයෙක් අවම වශයෙන් ලකුණු 40 ක් ලබා ගැනිමට අපොහොසත් වුව හොත් එම පාඨමාලාවට අදාළ සමස්ත අඛණ්ඩ ඇගයිම් ලකුණ (OCAM) එකතු නොවේ.

**(ආ) අවසාන ලිඛිත පරීක්‍ෂණයක් මගින් සිදු කෙරෙන ඇගයුම**

උක්ත වැඩසමටහනට අදාළ අවසාන ලිඛිත පරීක්‍ෂණය අදියර දෙකක් යටතේ පැවැත් වේ.

**අදියර-I** (STP8501, STP 8502, STP 8303, STP 8504 )

**අදියර-II** (STP 8505, STP 8306, STP 8307/ STP 8308, STP 8309/ STP 8310/ STP 8311/ STP 8312)

**(ඇ) ප්‍රායෝගික ඉගැන්වීම (STE 8811)**

ප්‍රායෝගික ඉගැන්වීම අදියර දෙකක දි අගයනු ලැබේ.

**(අ)** අදියර 1 - අපේක්‍ෂකයා සේවය කරන පාසලේ දි ප්‍රමුඛාචාර්යවරයකු මගින් පාඩම් 05 ක් ඇගැයීම.

මීට අමතරව ප්‍රායෝගික ඉගැන්වීම සිදු කරන පාසලේ දි උපාධ්‍යායවරයකු ගුරු ශිෂ්‍යයාට සහාය වනු ඇත. එම කාලය තුළ දි පාසල ආශ්‍රිතව ව්‍යාපෘතියක් කිරීම ද අවශ්‍ය වේ.

(අඛණ්ඩ ඇගැයීම : මෙම ලකුණු 40% ක් බවට පරිවර්තනය කෙරේ)

පළමු අදියර සමත් වූ සිසුන් පමණක් දෙවන අදියර සඳහා සුදුසුකම ලබනු ඇත.

**(ආ)** අදියර II - වෙනත් පාසලක දි විශ්වවිද්‍යාල කථිකාචාර්යවරයකු මගින් පාඩම් 02 ක් ඇගැයීම

(අවසාන පරීක්‍ෂණය : මෙම ලකුණු 60% ක් බවට පරිවර්තනය කෙරේ)

**2.7.1 සැලකිය යුතුයි**

ගුරුවරුන් නොවන අධ්‍යාපන ක්‍ෂෙත්‍රයේ නියුක්ත අයදුම්කරුවන් පහත සඳහන් ලිපි ලිඛිත පරීක්‍ෂණයෙන් සමත් වූ පසු කැඳවන සම්මුඛ පරීක්‍ෂණයට රැගෙන ආ යුතුය.

**අ.** ප්‍රායෝගික ඉගැන්වීම (STE8811) අදියර 1 නිම කිරීම සඳහා විදුහලක් (රජයේ හෝ රජයේ අනුමත) තමා විසින් ම තෝරා ගෙන විවෘත විශ්වවිද්‍යාලය විසින් නියම කරනු ලබන සති 10 ක කාල සීමාව තුළ තෝරාගත් එම විදුහලේ ඉගැන්වීම් කාර්යයේ නිරත වීමට අවසර දිය හැකි බවට විදුහල්පතිගෙන් ලබාගත් ලිපියක්

**ආ.** ප්‍රායෝගික ඉගැන්වීම (STE8811) අදියර 1 සඳහා විවෘත විශ්වවිද්‍යාලය විසින් නියම කරනු ලබන සති 10 ක කාල සීමාව තුළ අයදුම්කරුට නිවාඩු ලබා දිය හැකි බවට ආයතන ප්‍රධානියාගෙන් ලබාගත් ලිපියක්

**ඇ.** මෙම අයදුම්කරුවන් අදාළ සති 10 තුළ තෝරාගත් පාසලේ පූර්ණ කාලීනව ඉගැන්වීම් කටයුතුවල නිරත විය යුතු ය.

**ඈ.** ඉහත කොන්දේසි අනුව කටයුතු කිරීම අපහසු වන වෘත්තීය ගුරුවරුන් නොවන අයදුම්කරුවන්ට මෙම වැඩසටහන සඳහා අයදුම් කිරීමෙන් වැළකී සිටින ලෙසට උපදෙස් දෙනු ලැබේ.

**ඉ.** තෝරා ගැනීමෙන් පසුව අවශ්‍ය වන ලියකියවිලි පිළිබඳව වැඩිදුරටත් දැනුවත් කරනු ලැබේ.

## 2.8 සහතික ප්‍රදානය

විවෘත විශ්වවිද්‍යාලයේ විධිවිධානවලට අනුකූලව පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව ප්‍රදානය කරනු ලැබේ.

## 2.9 ගාස්තු

| | | |
|---|---|---|
| ලියාපදිංචි කිරීමේ ගාස්තු | රු. | 1000.00 |
| පහසුකම් ගාස්තු | රු. | 1500.00 |
| පුස්තකාල ගාස්තු | රු. | 200.00 |
| ශිෂ්‍ය උපදේශන ගාස්තු | රු. | 54,000.00 |
| ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා | රු. | 5000.00 |
| වැඩසටහන සඳහා සම්පූර්ණ ගාස්තු | රු. | 61,700.00 |

ශිෂ්‍යයින් විසින් අදාළ ගෙවීම් වාරික දෙකකින් සිදු කළ යුතු ය. ලියාපදිංචි වීමේ දී සම්පූර්ණ ගාස්තුවෙන් 60% ක් ගෙවිය යුතු අතර ඉතිරි 40% අධ්‍යයන වැඩසටහන අතරතුර දී ගෙවිය යුතු ය. විභාග අසමත් වන ශිෂ්‍යයින්ට නැවත ලියාපදිංචි වීමේ දී නැවත අධ්‍යයනය කිරීමට සිදු වන පාඨමාලා අනුව ගාස්තු ගෙවීමට සිදුවනු ඇත.

### අධ්‍යයන වැඩසටහන/පාඨමාලා වෙනස් කිරීම

ලියාපදිංචි වී ඇති සම්පූර්ණ අධ්‍යයන වැඩසටහන කල් දැමීමට අවසර දෙනු නොලැබේ. පාඨමාලා කල් දැමීමට අදහස් කරන අයදුම්කරුවන් අවම වශයෙන් ශාස්ත්‍රීය අගය 8 ක් වන පාඨමාලා සඳහා ලියාපදිංචිය අනිවාර්යයෙන්ම රඳවා ගත යුතු ය. පාඨමාලා කල් දැමිය හැකි කාල සීමාව වැඩසටහන ආරම්භ වී මාස 2 කින් අවසන් වේ. කුමන හේතුවක් නිසා හෝ මෙම දිනය දීර්ඝ කරනු නොලැබේ. නැවත ලියාපදිංචි වීමේ දී පළමු අවස්ථාවට වඩා වැඩි ගාස්තුවක් ගෙවීමට සිදු වනු ඇත.

**ලියාපදිංචි වූ වෛකල්පික පාඨමාලා වෙනස්කර ගැනීම/අවලංගු කර ගැනීම**

අයදුම්කරුවන් ලියාපදිංචි වන වෛකල්පික පාඨමාලා මාරු කිරීමේ කාලසීමාව වැඩසටහන ආරම්භ වී මාස 2 කින් අවසන් වේ. කුමන හේතුවක් නිසා හෝ මෙම දිනය වෙනස් කරනු නොලැබේ.

| |
|---|
| **1) පාඨමාලාවක ලියාපදිංචිය වෙනස්කර ගැනීම (Add/ Drop)**<br>**2019 පෙබරවාරි 21 සහ 22 යන දින පමණි**<br>**2) පාඨමාලාවක ලියාපදිංචිය අවලංගු කර ගැනීම (Drop Only)**<br>**2019 මාර්තු 19 දින පමණි** |

**ලියාපදිංචි වූ අධ්‍යයන වැඩසටහනින් ඉවත් වීම**

වැඩසටහනට ලියාපදිංචි වීමෙන් පසුව මසක් ඉකුත් වීමට පෙර 10% ක ගාස්තුවකට යටත්ව ලියාපදිංචි වූ අධ්‍යයන වැඩසටහනින් ඉවත් විය හැක. කුමන හේතුවක් නිසා හෝ මෙම දිනය දීර්ඝ කරනු නොලැබේ. විශ්වවිද්‍යාලය විසින් ලියාපදිංචි වීම/නැවත ලියාපදිංචි වීම සඳහා පැමිණිය යුතු බවට දන්වා එවන දිනයන්ට පසුව ලියාපදිංචි වීමේ කටයුතු කරනු නොලැබේ.

****සැළකිය යුතුයි**

| |
|---|
| **අධ්‍යයන වැඩසටහනට ලියාපදිංචි වූ පසු ඔබගේ ශිෂ්‍යභාවය පවත්වා ගත හැක්කේ ලියාපදිංචි වූ අධ්‍යයන වර්ෂය ද ඇතුළත්ව අධ්‍යයන වර්ෂ හතරක් (4) ක් පමණක් වන අතර, අඛණ්ඩ ඇගයීම්වල යෝග්‍යතාව පවත්වාගත හැකි වන්නේ ලියාපදිංචි වූ අධ්‍යයන වර්ෂය හැර තවත් එක් (1) අධ්‍යයන වර්ෂයක් පමණි.** |

**2.10 අධ්‍යයන වැඩසටහනෙහි ආරම්භය**

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහනේ අධ්‍යයන කටයුතු 2019 **ජනවාරි මස** ආරම්භ කිරීමට නියමිතය.

**රාජකාරී හෝ අධ්‍යයන නිවාඩු අනුමත කර ගැනීම සඳහා ඔබ පාසල අයත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඔබගේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන සඳහා වන අයදුම් පත්‍රය අනුමත කරවාගෙන එහි ජායා පිටපතක් ඔබ ළඟ තබා ගැනීම සහ එහි එක් ජායා පිටපතක් අදාළ කලාප කාර්යාලයේ ඔබගේ ලිපි ගොනුවට යැවීමට ද කටයුතු කිරීම ප්‍රයෝජනවත් වනු ඇත. පසුව ඉල්ලුම් පත්‍රයේ පිටපත් ලබා දෙනු නොලැබේ.**

**2.11 අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්**

## INSTRUCTIONS TO COMPLETE THE ON LINE APPLICATION FORM

(1) Login to the Open University web page by typing https://payment.ou.ac.lk/ Then you will see the following page:




If you are a new applicant click the hyper link <Create New Account>

If you are an existing OUSL student, type user name and password and press the login button.

(2) Then you will see the following page



(3) Once you enter all details and click the button <Create Account> you will see the following page:



(4) Click <Add New Application>

Then you will see the following page:

